## 94 – සුවඳ දිදි පිපුණ උදේ

සුවඳ දිදි පිපුණ උදේ සෙව්වන්දියක් වගේ
නිමල බවේ සුවඳින් මා පුබුදනු මැන සමිඳේ

දෙපයට පෑගෙන අවිහිංසක උඳුපියලි කොළේ වගේ
මා අවිහිංසක කළ මැන සමිඳුනි ඔබේ හදවත වාගේ

හිරු දැකලා ජලයෙන් පිටතට ඇදෙනා නෙලුමක් වාගේ
පාප බවින් මා පිටතට ගත මැන දකිනට වත ඔබගේ